# ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

# තනතුරු - පුරප්පාඩු

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ පුරප්පාඩුව පවතින බස්නාහිර පළාත් කාර්යාල සේවක සේවයේ III වන ශ්‍රේණියේ නුපුහුණු කම්කරු (මාර්ග / සෞඛ්‍ය/වෙනත්) තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් බස්නාහිර පළාතේ පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | | | |
|---|---|---|---|---|
| I. | වැටුප් බන්ධය හා | - | පී.එල්. 1-2006 (IV) (රා.පරි.ව.ලේ) | |
| II. | වැටුප් පරිමාණය | - | 11730 - 10 X 120 X- 10 X 130 - 10 X 145 - 12 X 160 - 17600/- | |
| III. | වයස් සීමාව | - | 2010.06.07 දිනට වයස අවුරුදු 18 - 45 ත් අතර විය යුතුය. | |
| IV. | අධ්‍යාපන සුදුසුකම් | - | (අ) | මාර්ග කම්කරුවන් හා සනීපාරක්ෂක / සෞඛ්‍ය කම්කරුවන් හැර වෙනත් කම්කරුවන් අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය සමත්වී තිබිය යුතුය. |
| | | | (ආ) | මාර්ග කම්කරුවන් අවම වශයෙන් 05 වැනි ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය. |
| | | | (ඇ) | සනීපාරක්ෂක කම්කරුවන් / සෞඛ්‍ය කම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |

**02. පොදු සුදුසුකම්**

1.අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2.යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

3.අයදුම්පත් කැඳවන දිනට පොරාතුව බස්නාහිර පළාත තුළ අවම වශයෙන් වසර 03 ක ස්ථිර පදිංචියක් තිබිය යුතුයි. (අයදුම්පත සමග පදිංචිය සනාථ කිරීමේ සහතිකයක් අමුණා එවිය යුතුය).

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි**

1.මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන්නන් වැන්දඹු හෝ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

2.මෙම තනතුරට බඳවා ගන්නන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වේ.

3.තනතුර ස්වභාවය අනුව, අනෙකුත් සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා රාජකාරි වේලාවන්, රජය පිළිගත් කම්කරු නීතිරීති වලට අනුකූලව ආයතන ප්‍රධානියා විසින් තීරණය කරනු ලැබේ.

**04. සේවා කොන්දේසි**

පත්වීම් ලබන්නන් ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලටද බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කළ පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසි වලටද, පළාත් පාලන ආයතනයට අදාළ ආඥාපනත් / අණ පනත්වල විධිවිධාන වලටද, පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලටද අනුකූලව කටයුතු කළ යුතුය.

ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් විසින් මෙම නිවේදනයේ ආදර්ශ ආකෘති පත්‍රය පරිදි 12" X 8" ප්‍රමාණයේ අයදුම්පතක් සකස් කර 2010.06.07 දිනට පෙර" නාගරික කොමසාරිස්, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව, රාජගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තවද අයදුම් කරන තනතුර අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ සඳහන්කළ යුතුය. අයදුම්පත් තැපෑලේදී නැතිවීම හෝ ප්‍රමාදවීම හෝ සම්බන්ධව කරනු ලබන පැමිණිලි පිළිබඳව සලකා බලනු නොලැබේ.

**2010.05.14 වන දින,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර මහ සභාව,**
**රාජගිරිය.**

**ශාන්තා පී ලියනගේ,**
**නාගරික කොමසාරිස් (වැ.බ.)**
**ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ නගර සභාව.**